සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

# සවිසුව

## කෘතිම පාද නිෂ්පාදන ව්‍යාපෘතිය

ඔවුන්ට නැවත ඇවිදීමට ඉඩ දෙමු ...................

# සවිසුව කෘතිම පාද ව්‍යාපෘතිය

- ඇවිදීම යනු මිනිස් ජීවිතයේ අතිශය වටිනා හැකියාවකි. ස්වාධීනව ගමන් කිරීමේ නිදහස පුද්ගලයෙකුට ආත්ම විශ්වාසය, ගෞරවය සහ සමාජයේ සක්‍රීය සාමාජිකයෙකු ලෙස ජීවත් වීමේ අවස්ථාව උදාකර දෙයි. එහෙත් අනතුරු, රෝගාබාධ, දියවැඩියාව නිසා සිදුවන සංකූලතා, උපතින් ඇතිවන ආබාධ සහ වෙනත් අනපේක්ෂිත හේතූන් නිසා ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසකට තම ස්වාභාවික ගමන් කිරීමේ හැකියාව අහිමි වේ.

- කෘතිම පාදයක් නොමැතිව ජීවත් වීමට සිදුවන බොහෝ ආබාධිත හා අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට අධ්‍යාපනය, රැකියාව, පවුල් වගකීම් ඉටු කිරීම සහ ස්වාධීන ජීවිතයක් ගත කිරීම දැඩි අභියෝගයක් බවට පත්ව ඇත. කෘතිම පාද සඳහා පවතින ඉහළ අවශ්‍යතාවය හා එම සේවාවන්හි සීමිත ප්‍රවේශය අතර පවතින පරතරය හඳුනාගනිමින්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් ජාතික මානුෂීය මෙහෙවරක් ලෙස "සවිසුව කෘතිම පාද ව්‍යාපෘතිය" ආරම්භ කර ඇත.









- මෙම උතුම් කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් කොළඹ 07 පිහිටි සිය මූලස්ථාන පරිශ්‍රයේ කෘතිම පාද නිෂ්පාදන වැඩමුළුවක් ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානය මගින් ගුණාත්මකභාවයෙන් යුත් කෘතිම පාද නිෂ්පාදනය කර ඒවා මිලදී ගැනීමට ආර්ථික හැකියාවක් නොමැති පුද්ගලයන් වෙත ලබාදීම සිදු කරයි. සෑම පුද්ගලයෙකුටම ගෞරවාන්විතව ඇවිදීමට සහ අර්ථවත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාව හිමිවිය යුතුය යන උතුම් සංකල්පය මත මෙම ව්‍යාපෘතිය පදනම් වී ඇත.

- ශ්‍රී ලංකාව තුළ කෘතිම පාද සඳහා පවතින අවශ්‍යතාවය ඉතා ඉහළ මට්ටමක පවතින අතර, ඒවා ලබාදෙන පහසුකම් හා සේවාවන් තවමත් ප්‍රමාණවත් නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ දෙනෙක් ගමන් කිරීමේ හැකියාව සීමා වීමෙන් ආර්ථික, සමාජීය හා මානසික දුෂ්කරතාවන්ට මුහුණ දෙති. සවිසුව ව්‍යාපෘතිය මෙම පරතරය අවම කරමින්, අවශ්‍යතාවයෙන් පෙළෙන පුද්ගලයන්ට ජීවිතය නැවත ගොඩනඟා ගැනීම සඳහා ප්‍රායෝගික හා තිරසාර විසඳුම් ලබාදීමට කැපවී සිටී.







මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වන්නේ වාර්ෂිකව කෘතිම පාද 500ක් ආබාධිත හා අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් වෙත ලබාදීමයි. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජාතිය හෝ සමාජ පසුබිම නොසලකා අවශ්‍යතාවය ඇති සෑම පුද්ගලයෙකුටම මෙම සේවාව ලබාදීමට ව්‍යාපෘතිය කැපවී සිටී.










ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව හා වෘත්තීයමය ප්‍රමිතීන් තහවුරු කිරීම සඳහා වෛද්‍ය සේවා, මූල්‍ය කළමනාකරණය, නිෂ්පාදන කළමනාකරණය, විකලාංග තාක්ෂණය **(ORTHOPEDIC TECHNOLOGY)**, භෞත චිකිත්සාව **(PHYSIOTHERAPY)**, පුනරුත්ථාපන සේවා සහ සමාජ සේවා යන ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම සහ අත්දැකීම් ඇති සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මගින් ව්‍යාපෘතිය මෙහෙයවනු ලැබේ.

මෙම බහුවිධ වෘත්තීය ප්‍රවේශය මගින් ප්‍රතිලාභීන්ට කෘතිම පාදයක් ලබාදීම පමණක් නොව, නිවැරදි වෛද්‍ය ඇගයීම්, සවිකිරීම්, භාවිත පුහුණුව සහ පුනරුත්ථාපන සහාය ද ලබාදේ.









මෙම බහුවිධ වෘත්තිය ප්‍රවේශය මඟින් ප්‍රතිලාභීන්ට කෘතිම පාදයක් ලබාදීම පමණක් නොව, නිවැරදි වෛද්‍ය ඇගයීම්, සවි කිරීම්, භාවිත පුහුණුව සහ පුනරුත්ථාපන සහාය ද ලබා දේ.





ඉන්දියාවේ සුරනා සහ සුරනා පදනම සමඟ සහයෝගීතාවයෙන් සහ ජාත්‍යන්තරව පිළිගත් ජායිපූර් පාද සංවිධානයේ මගපෙන්වීමෙන් ව්‍යාපෘතියේ තාක්ෂණික මගපෙන්වීම සහ නිෂ්පාදන සහාය ශක්තිමත් වේ. මෙම හවුල්කාරිත්වයෙන් ප්‍රතිලාභීන්ට විශ්වාසදායක, ප්‍රායෝගික සහ සුදුසු කෘතිම අත් පා විසඳුම් ලැබෙන බව සහතික කිරීමට උපකාරී වේ









සවිසුව කෘතිම පාද ව්‍යාපෘතිය හුදෙක් වෛද්‍ය සේවාවක් පමණක් නොවේ. එය ජීවිත නැවත ගොඩනඟන, බලාපොරොත්තු යළි අවදි කරන සහ මානව ගෞරවය යථා තත්ත්වයට පත් කරන කරුණාබර මානුෂීය මෙහෙවරකි. කෘතිම පාදයක් ලබන පුද්ගලයෙකුට නැවත ලැබෙන්නේ ගමන් කිරීමේ හැකියාව පමණක් නොව, ආත්ම විශ්වාසය, ස්වාධීනත්වය, බලාපොරොත්තුව සහ සමාජයට ඵලදායී ලෙස දායක වීමේ අවස්ථාවයි.
එමගින් රැකියාවකට යළි එක්වීමට, අධ්‍යාපනය ඉදිරියට ගෙන යාමට, පවුලට සහාය වීමට, අන්‍යයන් මත පවතින යැපීම අවම කර ගැනීමට සහ ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැලසේ.
මෙම ජාතික මානුෂීය මෙහෙවර සඳහා දානපතින්, ව්‍යාපාරික ආයතන, ආගමික සංවිධාන, පුණ්‍යායතන, විදේශීය දායකයන් සහ දේශීය හා විදේශීය සුහද හිතවතුන් වෙත සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ගෞරවයෙන් ආරාධනා කරයි.

රුපියල් **45,000**ක පරිත්‍යාගයකින් අවශ්‍යතාවයෙන් පෙළෙන පුද්ගලයෙකුට කෘතිම පාදයක් ලබාදිය හැකිය. එය හුදෙක් පරිත්‍යාගයක් නොව, මිනිසෙකුගේ ජීවිතය, ගෞරවය සහ අනාගතය යළි ගොඩනැඟීම සඳහා සිදු කරන ආයෝජනයකි.






# ඔබගේ දායකත්වය

**BANK NAME - BANK OF CEYLON**

**ACCOUNT NAME - සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සවිසුව ව්‍යාපෘතිය**

**ACCOUNT NUMBER – 0094808666**

**BRANCH – 453 TORRINGTON SQUARE**



**ආබාධිත පුද්ගලයෙකුට කෘතිම පාදයක් ලබාදෙන ඔබ, ඔහුට හෝ ඇයට නැවත ජීවිතය, නිදහස, ගෞරවය සහ බලාපොරොත්තුව තිළිණ කරයි.....**

**ඔබගේ කරුණාවෙන් කෙනෙකුට නැවත ඇවිදීමට හැකි වේ.**